# විද්‍යාර්ථීන්ගේ ප්‍රකාශනවල පවත්නා දූර්වලතා පිළිබඳ අධ්‍යයනය
## (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරිනි)

ඩී.එම්. සුනේත්‍රා සෙව්වන්දි[1]

**සංක්ෂේපය**

විශ්ව දැනුමේ කෙන්ද්‍රස්ථානයක් වූ විශ්වවිද්‍යාලයෙන් පෝෂණය වන විද්‍යාර්ථියා තමන් උකහා ගන්නා ලද දැනුම විශ්වයට දායද කිරීමේ පුරෝගාමී සඟයෙකු වේ. මෙහි තවත් එක් පියවරක් ලෙස විශ්වවිද්‍යාලය තුළ විද්‍යාර්ථියින් විසින් නව දැනුම ගවේෂණය සහ පවත්නා දැනුම බෙදාහැරීම අරමුණු කොට ගනිමින් නිබන්ධන, සඟරා සහ ලිපි එළිදැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබුව ද හුදෙක් එහි දැනුම ගවේෂණය කිරීමක් සත්‍ය වශයෙන් සිදුවනවා ද යන්න පිළිබඳ සොයා බැලීම මෙහි අරමුණ විය. මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්චා ක්‍රමය මඟින් දත්ත ලබා ගත් අතර ඒ සඳහා විද්‍යාර්ථියින් 100 දෙනෙකුගෙන් යුතු නියැදියක් සියලු පීඨයන් නියෝජනය වන පරිදි අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. නියැදිය මඟන් ලබා ගන්නා ලද දත්ත සංඛ්‍යාන ක්‍රමවලට භාජනය කිරීමෙන් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි. අධ්‍යයනයට අනුව, 70% පමණ සිසුන් නිබන්ධන, සඟරා සහා ලිපි සඳහා අන්තර්ජාලයෙන් හෝ වෙනත් මුද්‍රිත මාධ්‍යකින් උපුටා ගන්නා ලද තොරතුරු ඉදිරිපත් කරන බව නිගමනය විය. බොහෝ සිසුන් ප්‍රකාශ කරන ලද්දේ තමන් ඉදිරිපත් කරන මාතෘකාව පිළිබඳව තමන්වත් හරිහැටි නොදන්නා බවයි. නමුත් විශ්වවිද්‍යාල විද්‍යාර්ථියෙකුගේ මෙහෙවර විය යුත්තේ නව දැනුමක් තම නිර්මාණ තුළින් බිහිකිරීමක් මිස තවකෙකුගේ දැනුම කැටිකොට ඉදිරිපත් කිරීමක් නොවන බැව් බහුතරයෙකුගේ මතය විය. මේ සඳහා බලපාන ගැටලූ කිහිපයක් අධ්‍යයනයේ දී හඳුනාගන්නා ලදී. ඒවා නම් මේ පිළිබඳ විද්‍යාර්ථීන්ට නිවැරදි දැනුමක් හා මඟපෙන්වීමක් නොමැති වීම, විද්‍යාර්ථීන් ඉන් ඉදිරියට දැනුමක් ගවේෂණය කරන්නට දැනුම සොයා යන්නට මැලි බවක් දැක්වීමත් ය. අධ්‍යයනයෙන් අනාවරණය කරගන්නා ලද කරුණු අනුව පහත සඳහන් යෝජනා ඉදිරිපත් කෙරේ. එනම්, පර්යේෂණයක් සිදුකිරීමේ දී ඒ සඳහා අවශ්‍ය න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම මෙන්ම නිවැරදි පුහුණුවක් ද ලබාදිය යුතු බවත් විද්‍යාර්ථීන් විසින් ද තම අරමුණ නිවැරදිව හඳුනාගෙන නව දැනුමක් සමාජයට ලබාදීමට උත්සහ කල යුතු බවත් ය.

**මුඛ්‍ය පද :** *විද්‍යාර්ථියා, ගවේෂණය, දැනුම, අනාවරණය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
sunethrasewmi@gmail.com